**තිහගොඩ ප්‍රාදේශීය සභාව - 2023**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

තිහගොඩ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට තිහගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ස්වරූපයේ නොවන රු.83,160 ක් වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ අයිතම 8 ක්, ලී බඩු හා සවිකිරීම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ගෙවිය යුතු රු.103,040 ක් වූ වියදම් වෙනුවෙන් විවිධ ණයහිමියන් යටතේ ද කර්මාන්ත 9 ක් සඳහා ගෙවිය යුතු එකතුව රු.3,991,188 ක් ප්‍රාග්ධන ණයහිමි යටතේ ද ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | උඩුව නැගෙනහිර ඇල්ලන්තුඩුව අතුරු මාර්ගය සංවර්ධනය කිරිමේ කර්මාන්තය සඳහා ගෙවිය යුතු රු.712,745 ක් අඩුවෙන් ප්‍රාග්ධන ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සභා බලප්‍රදේශයේ ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 27ක් සඳහා ලැබිය යුතු රු.119,513 ක්, ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලිය රු.89,041 ක් හා ලැබිය යුතු උසාවි දඩ රු.895,907 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | භෞතික තොග ශේෂයක් නොමැති වූ තොග අයිතම 40 කට අදාලව වටිනාකම රු.540,894 ක් පාරිභෝගික තොග යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඊ) ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල රු.133,919 ක්, ලැබිය යුතු මුද්දර ගාස්තු රු.9,878,182 ක් හා මුද්දර ගාස්තු බිල් කිරීම් රු.138,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනයන්හි පැවති ගිණුම් විෂයයන් 02 ක ශේෂයන් හා ඊට අදාල උපයෝගී ලේඛණ/උපලේඛන ශේෂයන් අතර රු.1,127,360 ක වෙනසක් පැවතුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.14,005,055 ක් වූ ගිණුම් විෂයන් 9 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරියේදී නිවැරදි කරගැනීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.3,366,126 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ පුනරාවර්තන ආදායම රු 19,271,767 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,435,057 | 3,148,844 | 1,612,550 | 3,668,471 | 3,357,280 | 3,203,501 | 1,345,269 | 2,132,177 |
| (ii) | කුලී | 3,625,000 | 2,766,977 | 2,855,192 | 76,488 | 4,425,000 | 1,984,905 | 2,010,530 | 164,703 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,858,000 | 2,110,357 | 2,114,157 | - | 1,833,000 | 1,791,250 | 1,798,650 | 3,800 |
| (iv) | වෙනත් ආදායම් | 9,339,000 | 22,424,369 | 22,457,717 | 152,435 | 9,424,000 | 2,239,041 | 2,310,434 | 185,783 |
| | | 18,257,057 | 30,450,547 | 29,039,616 | 3,897,394 | 19,039,280 | 9,218,697 | 7,464,883 | 2,486,463 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| වරිපනම් ඒකක 2620 කින් රු.3,661,264 ක ශේෂයක් හා පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් මුද්දර ගාස්තු රු.3,796,473 ක් ලැබිය යුතුව පැවතුණි. | 2024 මැයි 05 දින වන විට හිඟ වරිපනම් රු.375,847 ක මුදලක් අය කර ගෙන ඇති බව හා ප්‍රධාන ලේකම්ගේ අංක CSS/8/4/1(iii) හා 2024.01.03 දිනැති ලිපිය මඟින් ලැබිය යුතු මුද්දර ගාස්තු ශේෂය දන්වා ඇති බව | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පනවා ඇති කාර්යන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ දිරාපත්වන කසළවලින් කොම්පෝස්ට් නිෂ්පාදනය සිදු කළද දිරාපත් නොවන හා ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ස්ථිර හා විධිමත් වැඩපිළිවෙලක් නොතිබීමෙන් පෞද්ගලික ඉඩමකට බැහැර කර පස්වලින් යට කිරීම සිදු කර තිබුණි. නොදිරන කසළ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ මාතර දිස්ත්‍රික් කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂකගේ අංක SU/MR/PTI/SZ/B26/2011/ 2016 හා 2021 පෙබරවාරි 18 දිනැති ලිපිය මගින් ලබාදී ඇති නිර්දේශ ක්‍රියාත්මක කර පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් කටයුතු කර නොතිබුණි. | පරිසර අධිකාරියෙන් ලබා දී ඇති කොන්දේසි වලට අනුව කටයුතු කරන බව. | පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකායර්ක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2022 දෙසැම්බර් 15 දිනැති අංක 2022/01 දරණ චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ප්‍රාදේශීය සභාව සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සඳහා 2023 ඔක්තෝබර් 10 දින රු.35,000 ක අත්තිකාරම් මුදලක් එක්තරා ආයතනයකට ගෙවා තිබූ අතර 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 179 ප්‍රකාරව සභාව විසින් තෝරාගත් සැපයුම්කරු සමඟ ඉටුකළ යුතු සේවා හා කොන්දේසි ඇතුළත් ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි. තවද ප්‍රාදේශීය සභාව මගින් මහජනතාව වෙත සිදු කරන සේවාවන් මාර්ගගත ක්‍රමයට ජනතාවට ලබාදීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණක් වුවද නිර්මාණය කර තිබූ වෙබ් අඩවියේ මාර්ගගත ක්‍රමයට ගෙවීම් පහසුකම් ලබාදී නොතිබුණි. | අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | සභා බල ප්‍රදේශය තුළ සංවර්ධන බලපත්‍ර ලබා ගැනීමෙන් තොරව නාගරික සංවර්ධන අධිකාරියේ 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත සැලසුම් හා සංවර්ධන නියෝග/රෙගුලාසිවලට අනුකූල නොවන පරිදි හා ගොඩනැඟිලි සීමාවන් උල්ලංඝනය කරමින් සිදු කරනු ලබන අනවසර ඉදිකිරීම් විධිමත් කිරීමට හෝ මුල් අවස්ථාවේදීම හඳුනාගෙන ගාස්තු අයකර එසේ කළ නොහැකි නම් එම ඉදිකිරීම අවසන් කිරීමට ප්‍රථම ඒවා සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන ඉවත් කිරීමට ක්‍රමවේදයක් සභාව විසින් හඳුන්වා දී නොතිබුණි. | අවශ්‍ය උපදෙස් ලබා ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත යොමු කර ඇති බව. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | -------------------- | ---------- |
| (අ) | සභාවට අයත් නාගරික සීමාව තුල පිහිටි ඉඩමක් අනුබෙදුම් කිරීමේදී පනවා ඇති කොන්දේසි ඉටුකර නොතිබියදී අවිධිමත් ලෙස අනුබෙදුම් අනුමත කර තිබූ අතර තවත් ඉඩමක් 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් නිවේදනයේ 27(1)(2) වගන්තිවල විධිවිධානවලින් බැහැරව අනුබෙදුම් අනුමත කර තිබුණි. | පුද්ගලික ඉඩම් අනුබෙදුමක් වන බවත් මේ වන විට මාර්ග පද්ධතිය සකසා ඇති බව. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | නාගරික සීමාව තුළ කැබලි කර වෙන්දේසි කරන ලද රූඩ් 03 පර්චස් 35.10 ක් වූ ඉඩමෙහි සත්‍ය විකුණුම් වටිනාකම සොයා බලා සියයට 1 ක හිඟ ගාස්තුව අය කර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | තක්සේරු වාර්තා ලබා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇති බව. | කඩිනමින් ගාස්තුව අය කළ යුතුය. |
| (ඇ) | නාගරික නොවන සීමාවට අයත් ඉඩම් කැබලි 02 ක් කැබලි කර විකිණීම සඳහා ඉඩම් වෙන්දේසි කිරීමේ සමාගමක් විසින් ඉඩම් අනුබෙදුම් අයදුම්පත් ඉදිරිපත් කර තිබුණද, ඉඩම් කැබලි කිරීම සඳහා ඉදිරිපත් කර තිබූ ඉඩම් අනුබෙදුම් අනුමත කිරීමේදී එලෙස සංවර්ධනය කිරීමට අදාළව ඉටු කළ යුතු කොන්දේසි ඇතුළත් සංවර්ධන බලපත්‍රයක් නිකුත් කර අදාළ කොන්දේසි ඉටු කළ බවට තහවුරු කර ගැනීමෙන් තොරව අනුබෙදුම් සැලසුම් අනුමත කර තිබුණි. 2023 නොවැම්බර් 23 වන දින විගණන පරීක්ෂාව සිදු කරන අවස්ථාව වන විටත් එක් ඉඩමක ප්‍රචාරණ කටයුතු සිදු කර ඉඩම් කැබලි විකිණීම ආරම්භ කර තිබූ නමුත් කැබලිවල විකුණුම් තක්සේරු වටිනාකම මත හෝ විකුණන ලද කැබලිවල සත්‍ය විකුණුම් වටිනාකම මත සියයට එකක ගාස්තුව අය කර නොතිබුණි. | එක් ඉඩමකින් සියයට එකක ගාස්තුව ගෙවා ඇති බවත් තක්සේරුව සඳහා යොමු කර ඇති බව. | කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/රෙගුලාසි ඇතුලත් 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් නිවේදනයේ 28(1) වගන්තියේ විධිවිධාන වලින් බැහැරව සභා බල ප්‍රදේශයට අයත් නාගරික සීමාව ඇතුළත (2022 ඔක්තෝබර් 19 දිනැති අංක 2302/20 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් තිහගොඩ ප්‍රාදේශීය සභාවට අයත් බල ප්‍රදේශය නාගරික බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට පෙර) ඉදිකර තිබූ හෝ ඉදිකරමින් පැවති ගොඩනැඟිලි 09 ක් සඳහා සංවර්ධන බලපත්‍රයක් ලබා ගෙන නොතිබුණු අතර තවද එම ඉදිකිරීම් සැලසුම් හා සංවර්ධන නියෝගවලට අනුකූල නොවන පරිදි ඉදිකර තිබුණි. | අදාල ආයතන සම්බන්ධ කර ගනිමින් සාකච්ඡාවක් පැවති අතර ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කර අවශ්‍ය පියවර ගන්නා බව. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවේ සේවයේ නියුතු ප්‍රාථමික ශ්‍රේණියේ කම්කරුවන් 08 දෙනෙකු වෙත තනතුරට අදාළ නියමිත රාජකාරි පැවරීමකින් තොරව රාජකාරි පවරා තිබූ අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී රු.3,296,622 ක මුදලක් සභා අරමුදලින් වැය කර තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමෙන් පසු එම වරද නිවැරදි කරන බව. | තනතුරට අදාල රාජකාරී පැවරීම් සිදු කළ යුතුය. |